මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්

2026 සැප්තැම්බර්

මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.75%ක් ලෙස **නොවෙනස්** ව පවත්වාගෙන යාමට මහ බැංකුව තීරණය කළේය

8.75%

වත්මන් ආර්ථික තත්ත්වය කෙසේ ද?



- 2026 වසරේ මැයි මාසයේ දී පූර්වෝපායික ක්‍රියාමාර්ගයක් ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සහ අනෙකුත් ක්‍රියාමාර්ගවල බලපෑම් බොහෝ දුරට ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වී ඇත
- මෑතකාලීනව බලශක්ති මිල ගණන් ආශ්‍රිත කම්පනයන්ගේ බලපෑම අනෙකුත් අංශ වෙත සම්ප්‍රේෂණය වීම හේතුවෙන් උද්ධමනය ඉහළ ගොස් ඇතත්, මැදිකාලීන උද්ධමන අපේක්ෂා බොහෝ දුරට 5% ඉලක්කය වටා ස්ථායීව පවතී
- 2026 වසරේ පළමු භාගයේ දී 4.7%ක ආර්ථික වර්ධනයක් වාර්තා කරමින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් ව පැවතුණි
- මෑත කාලීනව ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ණය වර්ධනය ක්‍රමයෙන් මන්දගාමී වුවද, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට ප්‍රමාණවත් ණය ප්‍රවාහයන් තවදුරටත් පවතී
- මැදපෙරදිග කලාපයේ අබණ්ඩව පවතින ආතතීන් මධ්‍යයේ වුව ද විදේශීය අංශය ශක්තිමත්ව පැවතුණි

අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?



- 2027 වසරේ පළමු කාර්තුව දක්වා උද්ධමනය ඉහළ තනි ඉලක්කමක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, පසුව එය 5%ක ඉලක්කගත මට්ටම කරා පහළ යනු ඇත.
- ආර්ථිකයේ ඉදිරිදැක්ම කෙරෙහි ගෝලීය හා දේශගුණික අවිනිශ්චිතතා මගින් බලපෑම් ඇති වුවද ආර්ථික ක්‍රියාකාරකම් අබණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ

මහ බැංකුව සිය ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී ඉදිරි දැක්මක් සහිතව මෙන්ම දත්ත මත පදනම්ව කටයුතු කරනු ඇත. උද්ධමන පීඩන නවදුරටත් නීවූ වුවහොත් හෝ උද්ධමන අපේක්ෂා ඉලක්කගත මට්ටමෙන් අපගමනය වීමක් පෙන්නුම් කළහොත්, මැදි කාලීනව ආර්ථිකයට එහි උපරිම බාධා මට්ටමට ළඟාවීම සඳහා සහාය වන අතර්ම, උද්ධමනය ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA